


# संस्कतभाषा कुञ्चिका ०३

# සංස්කෘත භාෂාව යතුර 03

**සංස්කරණය :-**

**සංස්කෘත විෂය භාර**

**පරිවෙණාචාර්ණීය**

**පූජ්‍ය වේළුසුමනපුර මෙත්තදින්නා මෙහෙණින් වහන්සේ**

# 1 පාඩම

★ සංස්කෘත අක්ෂර මාලාව 49 කි

➢ ස්වර 14කි

अ आ इ ई उ ऊ ऋ ॠ ऌ ॡ ए ऐ ओ औ

➢ ව්‍යඤ්ජන 35 කි

| | | | | |
|---|---|---|---|---|
| क | ख | ग | घ | ङ |
| च | छ | ज | झ | ञ |
| ट | ठ | ड | ढ | ण |
| त | थ | द | ध | न |
| प | फ | ब | भ | म |
| य | र | ल | व | |
| श | ष | स | ह | |
| अं | अः | | | |

❖ ස්වර ප්‍රභේද

➢ හ්‍රස්ව

උච්චාරණය කිරිමට මාත්‍රා එකක කාලයක් ගතවන ස්වර හ්‍රස්ව නම් වේ එවා 05 කි.

अ इ उ ऋ ऌ

➢ දීර්ඝ

උච්චාරණය සඳහා මාත්‍රා දෙකකට අධික කාලයක් ගතවන ස්වර දිර්ඝ නම් වේ එවා 09 කි.

आ ई ऊ ॠ ॡ ए ऐ ओ औ

- ප්ලුත

උච්චාරණය සඳහා මාත්‍රා දෙකකට අධික කාලයක් ගතවන ස්වර ප්ලුත නම් වේ. එය ලියා දැක්විය නොහැක. එනම් පහත අවස්තා වලදි ප්ලුත භාවිතා වෙයි.

- හැඬීමේ දී.
- ගායනයේ දී.
- විචාරයේ දී
- දුර සිටින කෙනෙකුට අඬගැසීමේ දී.

- සන්ධ්‍යාක්ෂර

අකුරු දෙකක් හෝ තුනක් එකට එකතුවී සෑදෙන අකුරු සන්ධ්‍යාක්ෂර නම් වේ. එවා 04කි. ए ऐ ओ औ

- නාමින්

නැමෙන හෙවත් වෙනස් වන හෙයින් නාමින් නම් වේ. अ आ දෙක හැර අනෙක් අක්ෂර නාමින් නම් වේ. इ ई उ ऊ ऋ ॠ ऌ ॡ ए ऐ ओ औ

- අනාමින්

अ अ දෙක නොනැමෙන හෙයින් එය අනාමින් අක්ෂර නම් වේ.

## ❖ ව්‍යඤ්ජන ප්‍රභේද

- වර්ගාක්ෂර

क අක්ෂරය මුල් කොට म අක්ෂරයෙන් අවසන් වන අකරු 25 වර්ගාක්ෂර නම් වේ.

क ख ग घ ङ - ක වර්ගය

च छ ज झ ञ - ච වර්ගය

ट ठ ड ढ ण - ට වර්ගය

त थ द ध न - ත වර්ගය

प फ ब भ म - ප වර්ගය

➢ අන්තඃස්ථාක්ෂර

වාඤ්ජන ස්වභාවයත් ස්වර ස්වභාවයත් ඇති බැවින් මෙම අකුරු අන්තඃස්ථාක්ෂර නමින් හැඳින් වේ. මෙයට අර්ධ ස්වර කියනු ලැබේ. එම අක්ෂර 04 කි.

य र ल व

➢ ඌෂ්මාක්ෂර

උණුසුමක් සහිතව උච්චාරණය වන බැවින් ඌෂ්මන් යනුවෙන් හැඳින්වේ. එම අකුරු 04කි. श ष स ह

➢ අනුස්වාරය

බින්දුව අනුස්වාරය නම් වේ. अं

➢ විසර්ගය

උඩ යට පිහිටන බින්දු දෙක විසර්ගය නම් වේ. अः

➢ වර්ගමූල

වර්ගයන්ගේ මුල පිහිටන අකුරු 05 වර්ගමූල නම් වේ.

क च ट त प

➢ වර්ගාන්ත / අනුනාසික

වර්ගයන්ගෙ අවසාන අකුරු 05 වර්ගාන්ත නම් වේ. එයට අනුනාසික ද කියනු ලැබේ. ङ ञ ण न म

➢ අල්පප්‍රාණ

අඩු ප්‍රාණයකින් හඬ හා වායු ධාරාව පිටවීමෙන් උච්චාරණය වන අකුරු අල්පප්‍රාණ අක්ෂර නම් වේ. වර්ගයන්ගේ 1 - 3 යන අකුරු 10 අල්පප්‍රාණ වේ.

क ग / च ज / ट ड / त द / प ब

➢ මහාප්‍රාණ

වැඩි ප්‍රාණයකින් හඬ හා වායු ධාරාව පිටවීමෙන් උච්චාරණය වන අකුරු මහාප්‍රාණ අක්ෂර නම් වේ. වර්ගයන්ගේ 2 - 4 යන අකුරු 10 මහාප්‍රාණ වේ.

ख घ / छ झ / ठ ढ / थ ध / फ भ

- අඝෝෂ

උච්චාරණය වන විට අඩු ශබ්දයක් සහිතව හඬ පිටවන හෙයින් අඝෝෂ නම් වේ. වර්ගයන්ගේ 1 -2 අකුරුත් श ष स යන අකුරුත් අඝෝෂ නම් වේ. අඝෝෂ අක්ෂර 13කි

क ख च छ ट ठ त थ प फ श ष स

- ඝෝෂ

උච්චාරණය වන විට වැඩි ශබ්දයක් සහිතව හඬ පිටවන හෙයින් ඝෝෂ නම් වේ. වර්ගයන්ගේ 3 ,4 ,5 අකුරුත් य र ल व ह යන අකුරුත් ඝෝෂ නම් වේ. ඝෝෂ අක්ෂර 20කි ( මිට අමතරව ස්වර 14 ද ඝෝෂ අක්ෂරවලටම අයත් වේ.)

ग घ ङ / ज झ ञ / ड ढ ण / द ध न / ब भ म / य र ल व ह

1.1 අභ්‍යාසය

01 හ්‍රස්ව :- अ इ उ ऋ ऌ

දීර්ඝ :- आ ई ऊ ॠ ॡ ए ऐ ओ औ

නාමින් :- इ ई उ ऊ ऋ ॠ ऌ ॡ ए ऐ ओ औ

අනාමින් :- अ आ

සන්ධ්‍යාක්ෂර :- ए ऐ ओ औ

02

1. අඬයි.
2. බුරයි.
3. නාද කරයි.
4. ''උන්නාන්සේ ''
5. දන්නෝ බුදුන්ගේ.........ශ්‍රී ධර්මස්කන්ධා.....
6. කෑ ගසයි.
7. හඬයි.
8. ප්‍රශ්ණ කරයි.

03.

- අන්තඃස්ථ - य र ल व
- වර්ගාක්ෂර - क ख ग घ ङ

  च छ ज झ ञ

  ट ठ ड ढ ण

  त थ द ध न

  प फ ब भ म

- ඌෂ්මාක්ෂර - श ष स ह
- අනුස්වාර - अं
- විසර්ග - अः

04

| වර්ගමූල | වර්ගාන්ත/ අනුනාසික | මහාප්‍රාණ | අන්තඃස්ථ | ඌෂ්මන් |
|---|---|---|---|---|
| क | न | फ | र | ष |
| क च | न | भ | ल | ष |
| च क | ण | | ल | श |
| प | म न | ध | ल | |
| प त | न | ठ | व ल | |
| क | न | घ | र | |
| ट | न | छ | ल | |
| क | म | झ झ | र | |
| प | म | थ | य | |
| च | | भ | र | |

05

| | | | | |
|---|---|---|---|---|
| क | ख | ग | घ | ङ |
| च | छ | ज | झ | ञ |
| ट | ठ | ड | ढ | ण |
| त | थ | द | ध | न |
| प | फ | ब | भ | म |
| य | र | ल | व | ह |
| श | ष | स | | |

● අඝෝෂ

● ඝෝෂ

06. මෙම අභ්‍යාසය සරල බැවින් නොදක්වමි.

# 02 පාඩම

## 2.1 ක්‍රියාකාරකම

### උයන

ළමයා උයනට යයි. එහි ගස්වල මල් පිපෙති. මල්වල මීමැස්සෝ සිටිති. උන් මලින් මලට ගොස් මල්වලින් පැණි බොති. පණ්ඩිතයෝ උන් මීමැස්සෝ යයි කියති. ළමයි වඳුරන්ට ගෙඩි දෙති. වඳුරා විසින් එය පැටියාට දෙනු ලැබේ. උයනේ ගස්වල කොළ සුළඟින් සෙලවෙනු ලැබෙති. අතුවලින් ගෙඩි වැටෙති. කුරුල්ලෝ දෙදෙනෙක් ද, වඳුරෝ දෙදෙනෙක් ද, ගස්වල අතුවල හිඳති. ළමයාගේ පියාද මවද අසුනේ සිටිත්. කුරුල්ලෝ පැටවුන් සමග එහෙ මෙහෙ ඉගිළෙති. පැටව් නායකයා සමග ක්‍රීඩා කරති. ලංකාවේ ජන නායකයින්ගේ පිළිරූ උයනේ වෙති. වැල්වල මල් ලස්සනය. වනිතාවෝ වැල්වලට ජලය ඉසිති. මල් බඹරුන්ට මීපැණි දෙති. උයන්පල්ලෝ ගසේ දිරූනු අතු ද වැල්වල මැලවුණු කොළ ද සිඳති. පාසල්වල ගුරුවරු සිසුන්ට උයනේ විසිතුරු මල් පෙන්වති. සංචාරකයෝ රියවලින් උයනට යති. ගුරුවරුන්ගේ අත්වල කුඩ ඇත. ශිෂ්‍යයෝ අත්වලින් ආහාර ගෙන එති. ඔවුහු ගස්වල සෙවණෙහි ආහාර පිණිස හිඳිති. උයන් බිමෙහි ඒ ඒ තැන පුවරු වෙති. ඵලකවල මෙසේ දක්නා ලැබේ. පින්වත් සත්පුරුෂයිනි, අප පරිසරය සුරකිමු යි.

## 2.1 අභ්‍යාසය

1. නපුරු ගමෙහි වාසයද, අනුන් යටතේ සේවය ද, නපුරු බොජුන් වැළිඳීම ද, නො මිහිරි තෙපුල් ඇති බිරිඳ ද, අනුව පුතා ද, වැන්දඹු ස්ත්‍රිය ද, මේ සය ඉහත ආත්මයෙහි නරක දුක් යයි කියති.

2. ගුරු අතින් අකුරු ද, මවගේ අතින් බොජුන ද, තම අතින් දානය ද, මර්දනයට අනුන්ගේ අතින් ද, කිරිම උතුම් වේ.

3. ඉතා කෝපි වූ ද, නපුරු වචන ඇත්තා වූ ද, දිළිඳු ඥාතීන් කෙරෙහි වෛරය ඇත්තාවූ ද නීච ක්‍රියාවෙහි නියුක්ත වූ ද, පරදාර සේවනය කළේ ද, අපායට යන මිනිසාගේ ලකුණුය.

4. කකුළුවාට මුතුහරින් ඇති ඵලය කිම? කොටළුවාට මිහිරි ආහාරින් ඇති ඵල කිම? අන්ධයාට පහන් එළියෙන් ඇති ඵලය කිම? බිරාට ගීතයෙන්ද, අනුවණයාට ධර්ම කථාවෙන් ඇති ඵලය කිම?

- ශ්ලෝකවල සිංහලාර්ථය ඇති නිසා විභක්ති පද නොදමි. විභක්ති පද සොයා ලියන්න.

## 2.2 අභ්‍යාස


| पद | विबक्ति | | | | | | | | वचन | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | प्रथमा | सम्बोधन | द्वितीया | तृतीया | चतुर्थी | पञ्चमी | षष्ठी | सप्तमी | एकवचन | द्विवचन | बहुवचन |
| बालकाः | √ | | | | | | | | | | √ |
| शकुनम् | | | √ | | | | | | √ | | |
| मृगैः | | | | √ | | | | | | | √ |
| सारथयः | √ | | | | | | | | | | √ |
| नृपतिना | | | | √ | | | | | √ | | |
| जन्तवे | | | | | √ | | | | √ | | |
| शशकस्य | | | | | | | √ | | √ | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| पित्रा | | | | √ | | | | | √ | | |
| निशापतेः | | | | | | √ | √ | | √ | | |
| वनितायाः | | | | | | √ | √ | | √ | | |
| वालुकायाम् | | | | | | | | √ | √ | | |
| शृगालौ | √ | | √ | | | | | | | √ | |
| प्रज्ञासु | | | | | | | | √ | | | √ |
| भार्याभिः | | | | √ | | | | | | | √ |
| तारकाम् | | | √ | | | | | | √ | | |
| उदकाय | | | | | √ | | | | √ | | |
| हे गायकाः | | √ | | | | | | | | | √ |
| छाययोः | | | | | | | √ | √ | | √ | |
| वार्तानाम् | | | | | | | √ | | | | √ |
| कर्त्रोः | | | | | | | √ | √ | | √ | |
| नेतृभ्यः | | | | | √ | √ | | | | | √ |
| नयनात् | | | | | | √ | | | √ | | |
| उटजे | √ | | √ | | | | | | | √ | |
| गगनयाभ्याम् | | | | √ | √ | √ | | | | √ | |
| खनित्रेण | | | | √ | | | | | √ | | |
| शिशवे | | | | | √ | | | | √ | | |
| इन्दुना | | | | √ | | | | | √ | | |
| अहीन् | | | √ | | | | | | | | √ |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| सूनवे | | | | | √ | | | | √ | | |
| हे नृपते | √ | | | | | | | | √ | | |
| सभायाः | √ | | | | | | | | | | √ |
| शास्तुः | | | | | | √ | √ | | √ | | |
| वस्त्रैः | | | | √ | | | | | | | |
| भूषणानि | √ | | | | | | | | | | √ |

## 03 පාඩම

### 3 .1 අභ්‍යාසය



## 3 .2 අභ්‍යාසය

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रतमपुरुष | धावति<br>कूजति<br>जयति | म्लायतः<br>गायतः<br>गच्छः | त्रस्यन्ति<br>राजन्ति<br>हरन्ति<br>वसन्ति |
| मध्यमपुरुष | वहसि<br>पश्तसि<br>खनसि | ताडयथः<br>तर्कयथः<br>पूजयथः | कर्षथ<br>नमथ<br>लालयथ |
| उत्तमपुरुष | तुष्यामि<br>इच्छामि<br>वपामि | रोदावः<br>पतावः<br>क्रीडावः | वदामः<br>चरामः<br>पठामः<br>आरोहामः |

## 3 .3 අභ්‍යාසය

| लट् | | | लङ् |
|---|---|---|---|
| 01 | क्रडति | 20 | अनमम् |
| 02 | कथयन्ति | 28 | अभजत् |
| 03 | हर्षथः | 14 | अवन्दाम |
| 04 | ताडयामि | 08 | अपठतम् |
| 05 | पूजयतः | 29 | अमुण्डम् |
| 06 | मुञ्चसि | 25 | उपाविशताम् |
| 07 | गायामः | 21 | अवदत् |
| 08 | पठथः | 11 | अरचयम् |
| 09 | पश्यावः | 03 | अहर्षतम् |
| 10 | जयन्ति | 06 | अमुञ्चः |

| | | | |
|---|---|---|---|
| 11 | रचयामि | 05 | अपूजयताम् |
| 12 | हर्षति | 30 | असिञ्चः |
| 13 | मिलसि | 24 | अपतन् |
| 14 | वन्दामः | 27 | अलभावहि |
| 15 | पालयथ | 13 | अमिलः |
| 16 | धावतः | 22 | अजीवाम |
| 17 | हसावः | 01 | अक्रीडत् |
| 18 | तरथः | 26 | अभवः |
| 19 | वसथ | 23 | अलिखतम् |
| 20 | नमामि | 19 | अवसत |
| 21 | वदति | 17 | अहसाव |
| 22 | जीवामः | 18 | अतरतम् |
| 23 | लिखथः | 15 | अपालयत |
| 24 | पतन्ति | 10 | अजयन् |
| 25 | उपविशतः | 16 | अधावताम् |
| 26 | भवसि | 09 | अपश्याव |
| 27 | लभाव | 04 | अताडयम् |
| 28 | भजति | 12 | अहर्षत् |
| 29 | मुण्डामि | 07 | अगायाम |
| 30 | सिञ्चसि | 02 | अकथयन् |

### 3.4 අභ්‍යාසය

१ . गजः अखादत्

२ . भिक्षु अचरत्

३ . वयम् अवन्दाम ।

४ . त्वं पाठम् अपठः ।

५ . मृगौ वने अवसताम् ।

६ . युवां पुस्तके अलिखताम् ।

७ . गुरुः शिष्यान् उपादिशन् ।

८ . अहं कुञ्जे शकुणम् अपश्यम् ।

९ . मण्डुकः सरसि अनदत् ।

१०. आवाम् पर्वतात् अपताव ।

## 04 පාඩම

### 4.1 ක්‍රියාකාරකම



(20 පිටුව)

1 පරිවෙණාධිපති පිරිවෙන පාලනය කරන්නේ ය.
2 සාමණේරවරු කෞතුකාගාරයට යන්නෝ ය.
3 අපි පොත පාඩම් කරන්නෙමු.
4 නුඹ අකුරු ලියන්නෙහි.
5 ශ්‍රී ලාංකික සියල්ලෝ අනාගතයෙහි සිනාසෙන්නෝ ය.
6 මම ධර්මය කියන්නෙමි.
7 නුඹලා යතිවරුන් වඳින්නාහු ය.
8 අපි දෙදෙන බිම හිඳ ගන්නෙමු.
9 භටසේනාවෝ දේශය රකින්නෝ ය.
10 නුඹලා දෙදෙන නාම ලේඛනය ගෙන යන්නාහු ය.
11 අමිත ද දමිත ද යාලුවෝ දෙදෙනෙක් වන්නාහ.
12 පරිගණකය ඉගැන්වීම් විෂයෙහි මහත් උපකාර වන්නේ ය.

## 4.2 ක්‍රියාකාරකම

1 පිරිවෙන පාලනය කරන්නේ කවුද?
2 මම කුමක් ලියන්නෙමි ද?
3 භට සේනාව කුමක් කරන්නෝ ද?
4 ඔබ කුමක් කරන්නෙහි ද?
5 ඉගෙනීමට කුමක් මහත් උපකාර වන්නේ ද?
6 තොපි කුමක් පාඩම් කරන්නාහු ද?
7 කවුරු කොහි යන්නෝ ද?
8 කවරෙක් කාහට කියන්නෝ ද?
9 අමිත ද දමිත ද කවුරු වන්නෝ ද?
10 තොපි දෙදෙන කොහි හිඳිනාහු ද?
11 කවුරු අනාගතයෙහි සිනාසෙන්නෝ ද?
12 අපි දෙදෙන කුමක් ගෙන යන්නෙමු ද?

## 4 .1 අභ්‍යාසය

| | පළමු පේළිය | | දෙවැනි පේළිය |
|---|---|---|---|
| 01 | मुण्डति - මුඩු කරයි | 06 | वादयिष्यन्ति - වයන්නෝ ය |
| 02 | वपामि - වපුරමි | 17 | सम्मिलिष्यन्ति - දෙදෙනෙක් හමුවෙන්නෙහු |

| | | | |
|---|---|---|---|
| 03 | अगच्छत् - ගියේ ය | 08 | लभिष्यसे - ලැබෙන්නේ ය |
| 04 | अपठम् - පාඩම් කළෙමි | 13 | गायिष्यतः - දෙදෙනෙක් ගයන්නෝ ය |
| 05 | रटसि - කෑ ගසයි | 01 | मुण्डिष्यति - මුඩු කරන්නේ ය. |
| 06 | वादयन्ति - වයති | 07 | धाविष्यन्ति - දුවන්නෝ ය |
| 07 | अधावन् - දිව්වෝ ය | 03 | गमिष्यति - යන්නේ ය |
| 08 | अलभथः - ලැබුවෙහි | 11 | प्रसीदिष्यथ පැහැදෙන්නෙහු |
| 09 | वर्जयामः - වර්ජනය කරමු | 02 | वपिष्यासि - වපුරන්නෙමි |
| 10 | अपतताम् - දෙදෙනෙක් වැටුණෝ ය | 18 | लिखिष्यामः - ලියන්නෙමු |
| 11 | प्रसीदथ - පැහැදෙහු | 04 | पठिष्यामि - පාඩම් කරන්නෙමි |
| 12 | अखादतम् - දෙදෙනෙක් කෑවෙහු | 14 | वन्दिष्यथ - වදින්නෙහු |
| 13 | गायतः - දෙදෙනෙක් ගයති | 05 | रटिष्यसि - කෑ ගසන්නෙහි |
| 14 | अवन्दत - වැන්දෙහු | 16 | क्रीडिष्यावः - දෙදෙනෙක් ක්‍රීඩා කරන්නෙමු |
| 15 | वदावः - දෙදෙනෙක් කියමු | 09 | वर्जयिष्यामः - වර්ජනය කරන්නෙමු |

| | | | |
|---|---|---|---|
| 16 | अक्रीडाव - දෙදෙනෙක් ක්‍රීඩා කළෙමු | 12 | खादिष्यथः - දෙදෙනෙක් කන්නෙහු |
| 17 | सम्मिलथः - දෙදෙනෙක් හමුවෙහු | 10 | पतिष्यतः - දෙදෙනෙක් වැටෙන්නෝ ය |
| 18 | अलिखाम ලීවෙමු | 15 | वदिष्यावः - දෙදෙනෙක් කියන්නෙමු |

# 05 පාඩම

උත්තර පඤ්චාල දේශයේ කිසියම් කැලෑ ප්‍රදේශක එක් පර්වතයක් විය. එහි ගිරා පැටව් දෙදෙනෙක් වාසය කරත්. ඒ පර්වතය මත ගොදුරුගමෙහි පන්සියයක් සොරු ද පර්වතය පහල රමණීය අසපුවක පන්සියක් තාපසවරු ද වාසය කරති. එක් දිනක හැමු සුළඟ ගිරා පැටවු දෙදෙන පැහැරගත්තේ ය. පසුව දෙදෙනා අතරින් එකෙක් සොරු අතරට වැටුණි.. ඌ නමින් ශස්ත්‍රගුල්ම යි. අනෙකා තාපසාරාමයට වැටුණේ ය. උගේ නම පුෂ්පක නම් විය.

එක දිනක පංචාල රජු ප්‍රධාන බොහෝ ජනයා වන ක්‍රීඩා පිණිස වනයට ගියහ. ක්‍රමයෙන් ඒ රජු සොරුන්ගේ ගොදුරු ගමට ගියේ ය. ගසක් මුල නිදාගත්තේ ය. එහි වසන ශාස්ත්‍රිගුල්ම රජු දැක මෙසේ කියයි. එම්බා සොරුනි, ගහමුළ කිසිවෙක් වෙයි. ඔහු සමීපයේ බොහෝ ආභරණ වෙති. ඒවා සියල්ල පැහැරගෙන අපි සැපෙන් ජීවත් වෙමු. උගේ ප්‍රකාශය අසා රජු රියදුරා සමග ඒ ගමෙන් පිටත් විය. අතරතුර ඔබිනොබ හැසිරෙන්නේ ඒ රජු පර්වතය මුල තාපසාරාමයට ගියේ ය. එහි පුෂ්පක ගසේ අත්තක හුන්නේ විය. රජු දැක ඌ ප්‍රීතියෙන් මිහිරි එළ අනුභව කරන්න. සිසිල් දිය බොන්න. ඉක්බිති ගිරවා ආදර සහිතව සැපදුක් විමසයි. ආහාරයට ගෙඩියක් දෙයි. ආසනයක් දෙයි. සිසිල් දිය දෙයි.

රජු උගේ ආගන්තුක සත්කාරයෙන් ඉතා සතුටට පත්ව ඒ ගිරව් දෙදෙනාගේ සම විෂම බව සිතා විමසයි පින්වත් ගිරවානෙනි, නුඹලා දෙදෙන රූපයෙන් සමාන ය. ගුණයෙන් නැත කුමක් නිසා මෙසේ වන්නේදැයි නුඹ සිතහි ද? ගිරවා කීය. පින්වත් රජතුමනි, පෙර අප දෙදෙනා සහෝදර වන්නේමු. එසේ වුවත් ඔහු සොරුන්ගේ සමීපයෙහි වැඩුණි. මම තාපසාරාමයේ වැඩුනෙමි. පසුව ඒ ගිරවා මේ ධර්මය දේශනා කළේ ය. යමෙක් සත්පුරුෂයන් ඇසුරු කරයි ද, ඒකාන්තයෙන් ඔහු සත්පුරුෂයෙක් වන්නේ ය. යමෙක් අසත්පුරුෂයන් ඇසුරු කරයි ද, ඒකාන්තයෙන් ඔහු අසත්පුරුෂයන් වන්නේ ය. එහෙයින් අපි සත්පුරුෂයන් සමග මිත්‍රත්වයට පැමිණ සත්පුරුෂයන් වන්නෙමුයි. පෙර ශස්ත්‍රිගුල්ම දැන් දේවදත්ත හිමි ය. පුෂ්පක මම බුදු රජ වෙමි.

## 5.1 ක්‍රියාකාරකම

- शुकपोतकौ - ප්‍රථමා / ද්වි වචන
- पर्वतस्य - ෂෂ්ඨී / ඒක වචන
- चोरानामन्तरे - සප්තමි / ඒක වචන
- वनक्रडयै - චතුර්ථි / ඒක වචන
- चोराणां - ෂෂ්ඨී / බහු වචන
- राजानं . - ද්විතීයා / ඒක වචන
- प्रकशं - ප්‍රථමා / ඒක වචන
- शाखायां - සප්තමි / ඒක වචන
- वण्या - තෘතීයා / ඒක වචන
- तयोः शुकयोः - සප්තමි / ද්වි වචන
- युवां - ද්විතීයා / ද්වි වචන
- भ्रातरौ - ප්‍රථමා / ද්වි වචන
- सत्पुरुषान् - ද්විතීයා / බහු වචන
- असत्पुरुषान् - ද්විතීයා / බහු වචන
- साधुभिः - තෘතීයා / බහු වචන
- देवदत्तस्थविरः - ප්‍රථමා / ඒක වචන

# 06 පාඩම

## 6.1 අභ්‍යාසය

१ सः ३ सः

२ वयं ४ सः

५ अहं ८ सा

६ ते ९ ते

७ सः १० तौ

1 ඔහු ධර්මය කියයි.
2 අපි පහන් දල්වමු.
3 ඔහු පාත්‍රය ගනි යි.
4 ඔහු ඇඳේ නිදයි.
5 මම බෝමළුව පිරිසිදු කරමි.
6 ඔවුහු පිරිත් දේශනාව අසති.
7 ඔහු පිංකම් කරයි.
8 ඇය දරුවා නළවයි.
9 ඔවුහු පුවත්පත මිළදී ගනිති.
10 ඔවුහු දෙදෙන ප්‍රත්‍යශතකය පාඩම් කරත්.

## 6. 2 අභ්‍යාසය

- පුතා - අම්මේ මේ කවුද ?
- මව - පුතේ මේ භටයෙක්
- පුතා - භටයා මොනවාද කරන්නේ?
- මව - ඔහු අපේ රට ආරක්ෂා කරනවා
- පුතා - ඇත්ත ඔහුගේ ඇඳුම ලස්සනයි. මමත් රට රකින්නෙක් වන්නෙමි.
- මව - එසේම වේවා...... නුඹේ ප්‍රාර්ථනාව සඵල වේවා...........

## 6. 3 අභ්‍යාසය

මේ අපගේ විහාරයයි. මම දිනපතා එහි යමි. එය විසිතුරු ය. එහි චෛත්‍යක් තිබේය. එය ඉදිරියෙහි උපාසිකාව සිටියි. ඇය චෛත්‍ය වඳියි. ඇයගේ දියණියෝ දෙදෙනා බෝධි මළුව පිරිසිදු කරත්. ඒ දෙදෙනා සුදු ඇඳුමින් සැරසෙත්. දකුණු පස සාමණේරයන් වහන්සේලා පෙනේ. ඔවුහු ඒ බෝධීන් වහන්සේ වඳිති. අපගේ බෝධීන් වහන්සේගේ බොහෝ කොඩි බැබළෙත්. ඒවා සුළඟට සෙලවෙත්. මේ විහාර භූමිය අපගේ සිත සමාධියට පත්කරයි. එම නිසා සියලු දායකයෝ මෙහි පැමිණෙති. ඔවුන් වඳිති. ඇවිදිති. කිසියම් අය ලොකු හාමුදුරුවෝ සමග ධර්ම කථාවක් කරති.

# 07 පාඩම

7.1 අභ්‍යාසය

| | |
|---|---|
| १. सः | अग्रजः |
| २. तौ | पितामहः |
| ३ . ते | यैद्याः |
| ४. त्वं | दशशीलमातरः |
| ५ . आवाम् | लेखकाः |
| ६. यूयं | महाशयौ |
| ७. तानि | परिगणकम् |
| ८ . सा | जनाधिपः |
| ९ . तत् | बुद्धश्रावकौ |
| १० . ताः | यतयः |
| ११ . अहं | गीतानि |
| १२. वयं | वार्ताः |

7.2 අභ්‍යාසය

| | | | | |
|---|---|---|---|---|
| १ सा | ३ ते | ५ तौ | ७ ते | ९ सः |
| २ तौ | ४ तत् | ६ ते | ८ सः | १० स |

1. ඒ උපාසිකාව බුදුන් වහන්සේ වදියි.
2. ඒ ගොපල්ලෝ දෙදෙන ගොන්නු දෙදෙන ගෙනයත්.
3. ඒ භික්ෂූන් වහන්සේලා පිඬු පිණිස හැසිරෙති.
4. ඒ පොත පුස්තකාලයේ ඇත.
5. ඒ ශිෂ්‍යයෝ දෙදෙන ඉගෙනීම සඳහා යත්.
6. ඒ උපාසකයෝ මල් පූජා කරති.
7. ඒ සාමණේරයන් වහන්සේලා යහපත් වචන කතා කරති.
8. ඒ ගුරුවරයා කාර්යාලයේ සිටියි.
9. ඒ භිගන්නා ධර්මශාලාවේ නිදයි.
10. ඒ ජනයෝ අපගේ දේශය නොබලති'

7.3 අභ්‍යාසය

१ सः बालकः ।

२ तौ शिश्यौ ।

३ ते दायकाः ।

४ तत् पात्रम् ।

५ तानि पस्तकानि ।

६ अहं भिक्षु ।

७ आवाम् सुखायौ ।

८ वयंव्यापारिकाः ।

९ त्वं नायकः ।

१० तौ भ्रातरौ ।

११ ते आगन्तुकाः ।

१२ तानि चित्रानि ।

## 08 පාඩම

ළමයා ගයයි. ඔහු මිහිරිව ගයයි. සාමණෙරයන් වහන්සේලා දෙදෙනම පාඩම් කරත්. ඔවුහු දෙදෙන පරික්ෂණයෙන් සමත් වෙත්. ශිෂ්‍යයෝ ශාලාවෙහි හිඳිති. ඔවුහු පාඩම් කරති.

මෙහි බාලිකාවක් සිටියි. ඇය නන්දාගේ සොයුරියයි. සොයුරා කොහි වසයි ද? ඔහු තම ගෙදර වාසය කරයි. මෙය අමු ගෙඩියකි එය මිහිරියි. බොහෝ දුම්රිය වෙති. ඒවා ඉතා වේගයෙන් ගමන් කරති. මෙහි බොහෝ විවර ඇත. ඒවා කහපාටින් බබළති. උපාසිකාවෝ පන්සලට යති. ඕ තුමූ ධර්මය අසති. ගොවියෝ දෙදෙන කුඹුරට යත්. ඔවුහු දෙදෙන සීසාත්.

8.1 අභ්‍යාසය

१ . ते　　३. ताः　　५ . तानि　　७. तौ　　९ . सः

२ . ते　　४. तत्　　६. तत्　　८. सः　　१०. सा

1 ළමයි පාසලට යති. ඔවුහු රියෙන් යත්.
2 සිංහයෝ කැලේ වාසය කරත් උන් සැඩපරුෂය.
3 නිවේදිකාවෝ වාර්තා කියති. ඇලා මනාකොට කියති.
4 මල ලස්සනය. එසේ වුවත් එය මැලවෙයි.
5 ලේඛකයෝ පොත් ලියති. ඒවා කවියෝ කියවති.
6 පාසලේ ඔරලෝසුවක් ඇත. එය වෙලාව දක්වයි.
7 විදේශිකයෝ දෙදෙන හික්කඩුවේ නගරයේ වසත්. ඔහු දෙදෙන මුහුදු තීරයෙහි හැසිරෙත්.
8 යාචකයා රියට පැමිණෙයි. ඔහු මිහිරි ගීයක් ගයයි.
9 කාලිදාස මහා කවියෙක් විය. ඔහු රඝුවංසය ලිව්වේ ය.
10 විහාර මහා දේවිය කාවන්තිස්ස රජුගේ දේවියයි. ඇය ගාමිණී කුමාරයාගේ මවයි.

## 8.2 අභ්‍යාසය

१ आदिवासिनः वने वसन्ति। ते मधुनि निस्पादयन्ति।

२ बालकः पुस्तकालं गच्छति। सः नव शब्दानि परिजानाति।

३ अत्र मधुनि सन्ति। तानि देषियनिष्पादनानि भवन्ति।

४ क्रिडिकाः विदेशं सम्प्राप्ताः ताः चशकम् आनयन्।

५ एतद् चित्रम् पश्य।तत् विचित्र।

## 8. 3 අභ්‍යාසය

මහා මහින්ද ස්ථවිරයන් වහන්සේ පොසොන් මාසයේ ලංකාවට වැඩියහ. ඔහු (උන්වහන්සේ) ධර්මාශෝක රජතුමාගේ පුතා ය. ඔහුගේ දියණිය සංඝමිත්තා නම් විය. ඇය (සංඝමිත්තා තෙරණින් වහන්සේ) ශ්‍රී මහා බෝධින් වහන්සේ වහන්සේ වැඩම කරවී ය. එය අද අනුරාධපුරයේ ඇත. ඇය (සංඝමිත්තා තෙරණින් වහන්සේ) සමග බොහෝ ජනතාවක් වූහ. ඔවුහු විවිධ කටයුතුවල දක්ෂයෝ වූහ. එකල දේවානම්පියතිස්ස ලංකාවේ රජු ය. අනුලා දේවිය ඔහුගේ මහේෂිකාව විය. ඇය මෙහි ප්‍රථම භික්ෂුණීය විය.

## 8.4 අභ්‍යාසය

१. बहुनां

२. सर्वान्

३ एकस्मिन्

४ द्वौ

५ सर्वाणि

६ सर्वा

७ बहवः। उत्तरस्या

1 බොහෝ ජනතාවගේ හිතසුව පිණිස බුදුරාජාණන් වහන්සේ ධර්මය දේශනා කළේ ය.
2 රජතුමා සියළු සතුරන් දිනුවේ ය.
3 එක් කාලෙක ලංකාවේ මහා දුර්භික්ෂයක් වූයේ ය.
4 පෙර ලංකාවෙහි සුභ ද යස ද නම් ඇති මිත්‍රයෝ දෙදෙනෙක් වූහ.
5 පිරිත් දේශනාවේ ආනුභාවයෙන් සියලු උපද්‍රව විනාස වේවා.
6 පොළවෙහි සියළු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා.
7 බොහෝ ව්‍යාපාරිකයෝ මේ කාලයෙහි උතුරු දිසාවේ හැසිරෙති.

## 09 පාඩම

1 වඳුරා ගස මුදුනින් වැටෙයි.
2 සිංහරාජ වනයෙහි මිහිරි ඵල ඇත.
3 අහසෙහි කලු ද සුදු ද වලාකුලු දක්නට ලැබෙති.
4 කුමාරිකාවෝ විසිතුරු උයන්වල ලස්සන මල් බලති.
5 උපාසිකාව බුද්ධ පූජාවට ලස්සන මාලාවක් සුදානම් කරන්නී ය.
6 භික්ෂූන් වහන්සේලා මිහිරි දේශනාවලින් ජනතාව අවබෝධ කරවති.
7 ගංගා අතුරින් මහවැලි ගඟ දිගම ගඟයැයි කියනු ලැබේ.
8 උස් මුදුන්වලින් පිදුරුතලාගල නම් පර්වතය උසම වේ.
9 කතරගම පූජා භූමි ප්‍රදේශයෙහි කඩවල රසවත් වූ කැවිලි ඇත.
10 ගීත ගෝවින්දය රමණීය කාව්‍යයක් යැයි සමහරු වර්ණනා කරති.

### 9. 1 අභ්‍යාසය

1. රාහුල නුඹ කුමන අතකින් ලියනනේහි ද?
2. නන්ද මම මේ අතින් ලියමි.
3. එකක් දකුණු අත ය. අනෙක වම් අත ය.
4. එක් අතක ඇඟිලි පහක් ඇත..
5. අත් දෙකෙහි ඇඟිලි දහයක් ඇත.

### 9. 2 අභ්‍යාසය

१. एकः / एका – මෙහි එක් පිරිමි ළමයෙක් ද ගැහැණු ළමයෙක් ද සිටිත්.

२ . बहूनि – ඔහුට බොහෝ ධනය වෙති

३ . सर्वे – අපගේ ගමේ සියලු ගොවියෝ නිරෝගීමත් වෙත්වා.

४. सर्वेसु – රාහුල ස්ථවිරයන් වහන්සේගේ කීර්තිය සියලු දිශාවල ව්‍යාප්තවිය.


५ . तस्य – ඒ ගුරුවරයාගේ දහම් දෙසුම මිහිරිය.

६ . सर्वेषु – භික්ෂූන් වහන්සේලා සියලු ජනතාව කෙරෙහි දයාව දක්වති.

## 9.3 අභ්‍යාසය

| | |
|---|---|
| १ . सर्वेषाम् | विहारे |
| २ . एकस्मिन् | दिशायाम् |
| ३ . दाक्षिण्याम् | रिपून् |
| ४ . तस्मात् | काले |
| ५ . द्वौ | नदीनाम् |
| ६ . अस्मिन् | जनानाम् |
| ७ . सर्वान् | दिशि |
| ८ . एका | वनात् |
| ९ . सर्वासाम् | बालिका |
| १० . उत्तरस्यां | बालकौ |

## 9.1 ක්‍රියාකාරකම




# 10 පාඩම

## 10.1 අභ්‍යාසය

| | | |
|---|---|---|
| तु | ताम् | आन्तु |
| हि | तम् | त |
| आनि | वा | आम |

## 11.2 අභ්‍යාසය

१. देशयति - देशयतु - දේශනා කරාවා

२. लसति - लसतु - බබලාවා

३. रक्षति - रक्षतु - රකීවා

४. प्रीणयति - प्रीणयतु - පිනවාවා

५. जयति - जयतु - දිනාවා

६. गच्छति - गच्छतु - යාවා

७. प्रविशति - प्रविशतु - පිවිසේවා

८ पिबति - पिबतु - බෝවා

९ पश्यति - पश्यतु - බලාවා

१० नृत्यति - नृत्यतु - නටාවා

10.3 අභ්‍යාසය

१. नमतः - नमताम् - දෙදෙන නමදිත්වා

२. वन्दतः - वन्दताम् - දෙදෙන වදිත්වා

३. पठतः - पठताम् - දෙදෙන පාඩම් කරත්වා

४. तुष्यतः - तुष्यताम् - දෙදෙන සතුටු වෙත්වා

५. उपविशतः - उपविशताम् - දෙදෙන වාඩිවෙත්වා

६. लभतः - लभताम् - දෙදෙන ලබත්වා

७. नयतः - नयताम् - දෙදෙන ගෙනයත්වා

८. प्रभवतः - प्रभवताम् - දෙදෙන ආයාචනා කරත්වා

९ विन्दतः - विन्दताम् - දෙදෙන විඳිත්වා

१०. भवतः - भवताम् - දෙදෙන වෙත්වා

## 10.4 අභ්‍යාසය

१ पचन्ति - पचन्तु - පිසත්වා

२.आरोहन्ति - आरोहन्तु - නගිත්වා

३ संगच्छन्ति - संगच्छन्तु - එකතුවෙත්වා

४ निषीदन्ति - निषीदन्तु - සිටිත්වා

५ व्रजन्ति - व्रजन्तु - යත්වා

६. निष्क्रमन्ति - निष्क्रमन्तु - නික්මෙත්වා

७. पालयन्ति - पालयन्तु - පාලනය කරත්වා

८. प्रीणयन्ति - प्रीणयन्तु - පිනවත්වා

९ भुञ्जन्ति - भुञ्जन्तु - අනුභව කරත්වා

१०.वदन्ति - वदन्तु - කියත්වා

## 10.5 අභ්‍යාසය

| एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|
| १ विनयतु | विनयताम् | विनयन्तु |
| २ अपहरतु | अपहरताम् | अपहरन्तु |

| | | |
|---|---|---|
| ३ प्रविशतु | प्रविशताम् | प्रविशन्तु |
| ४ परिचारयतु | परिचारयताम् | परिचारयन्तु |
| ५ सरतु | सरताम् | सरन्तु |
| ६ जयताम् | जयताम् | जयन्तु |
| ७ पचतु | पचताम् | पचन्तु |
| ८ व्रजतु | व्रजताम् | व्रजन्तु |
| ९ निष्क्रमतु | निष्क्रमताम् | निष्क्रमन्ता |
| १० निषीदतु | निषीदताम् | निषीदन्तु |

10.6 අභ්‍යාසය

१ भवतु - ළමයා හොඳ යාලුවෙක් වේවා

२ प्रविशतु - සත්පුරුෂයින් නිර්වාණයට පැමිණෙත්වා

३ भवतु - ගුරුවරයා දෙවියෙක් වේවා

४ जयतु - සත්‍යය දිනාවා

५ आनयताम् - මිතුරෝ දෙදෙනා මල් ගෙන එත්වා

६ भजतु / त्यजतु - සාමණේරයන් වහන්සේ ධර්මය ඇසුරු කරාවා අධර්මය දුරු කරාවා

७ वदतु - හෙතෙම සත්‍යය කීයාවා

८ नृत्यतु - මොණරු දෙදෙනා ප්‍රසාදයේ මුදුනේ නටත්වා

९ अनुभवतु - ජනයා සැමදාම සතුට අනුභව කරාවා

८ पठन्तु - අපගේ ශිෂ්‍යයෝ හොඳින් පාඩම් කරත්වා

10.7 අභ්‍යාසය

| | |
|---|---|
| जयतु | දේශනා කරත්වා! |
| प्रीणयन्तु | ජය ලබත්වා! |
| लभन्तु | භාවනා කරත්වා! |
| इच्छताम् | පිනවත්වා! |
| ध्यायन्तु | (අනාගතයේ) වේවා! |
| देशयन्तु | ලබත්වා! |
| तुष्यताम् | වාසය කරත්වා! |
| गायतु | (දෙදෙන) කැමති වෙත්වා! |
| विहरतु | ගායනා කරත්වා! |
| भविष्यतु | (දෙදෙන) සතුටු වෙත්වා! |

10.8 අභ්‍යාසය

चैत्यः - जयतु , वदतु लसतु , पश्यतु , धावतु , हरतु , तिष्ठतु

बोधिः - देशयताम् , पचताम्, नयतामठ , लभताम्, विशताम् , प्रीणयताम्


विहरः - देशयन्तु , विदन्तु , समर्थयन्तु , पठन्तु

# 11 පාඩම

## 11.1 අභ්‍යාසය

| | | |
|---|---|---|
| १ | गायसि - ගයහි | गाय - ගයන්න |
| | गायथः - දෙදෙන ගයහු | गायतम् - දෙදෙන ගයහුවා |
| | गायथ - ගයහු | गायत - ගයහුවා |
| २ | जीवसि - ජීවත් වෙහි | जीव - ජීවත් වන්න |
| | जीवथः - දෙදෙන ජීවත් වෙහු | जीवतम् - දෙදෙන ජීවත් වහුවා |
| | जीवथ - ජීවත් වෙහු | जीवत - ජීවත් වහුවා |
| ३ | नयति - ගෙනයහි | नय - ගෙනයන්න |
| | नयथः - දෙදෙන ගෙනයහු | नयतम् - දෙදෙන ගෙනයහුවා |
| | नयथ - ගෙනයහු | नयत - ගෙනයහුවා |
| ४ | जानसि - දැනගනිහි | जान - දැනගන්න |
| | जानाथः - දෙදෙන දැනගනිහු | जानातम् - දෙදෙන දැගනිහුවා |
| | जानाथ - දැනගනිහු | जानात - දැනගනිහුවා |
| ५ | लिखसि - ලියහි | लिख - ලියන්න |
| | लिखथः - දෙදෙන ලියහු | लिखतम् - දෙදෙන ලියහුවා |
| | लिखथ - ලියහු | लिखत - ලියහුවා |

11.2 අභ්‍යාසය




11.3 අභ්‍යාසය

1 නුඹ ළිඳෙන් ජලය ගෙන එන්න.
2 නුඹලා සත්‍ය කියහුව.
3 නුඹලා දෙදෙන විහාරයට යහුවා.
4 නුඹ ක්‍රීඩාංගනයෙහි හොඳට  ක්‍රීඩා කරන්න.
5 දරුව, පියාට ගරු කරන්න.
6 රේවත, නුඹ හොඳින් ධර්මය පාඩම් කරන්න.
7 ළමයි සඳ බලහුවා.
8 නායකයෝ දෙදෙන රට දිනත්වා.
9 නුඹලා දිනපතා පිරිවෙනට පැමිණෙහුවා.
10 රජවරු සැමදා ජනයා දැහැමින් රකිත්වා.

11.4 අභ්‍යාසය

१ माता आहारं पचतु ।

२ त्वम् धर्मेण जिवितं जय ।

३ युवाम् धर्मशालायां गच्छतम् ।

४ बालकाः पुस्तकानि पठन्तु ।

५ सर्वे पालकाः युक्तिगरुकम् भवतु ।

६ वृक्षाः फलन्तु ।

७ पुत्रौ स्वस्य मायरम् तुष्यताम् ।

८ सर्वदा सैनिकान् स्मर ।

९ दिवा च रत्ती च पुण्यानि कुरु ।

१० यूयम् सत्यं वदत ।

11.5 අභ්‍යාසය

तु - पचतु - පිසාවා

आम - पचाम - අපි දෙදෙන පිසමුවා

ताम् - पचतम् - දෙදෙන පිසත්වා

आव - पचाव - අපි දෙදෙන පිසමුවා

त - पचत - පිසහුවා

आनि - पचानि - පිසිම්වා

न्तु - पचतम् - දෙදෙන පිසහුවා

हि - पच - පිසින්න

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | तु | ताम् | अन्तु |
| मध्यमपुरुष | हि | तम् | त |
| उत्तमपुरुष | आनि | आव | आम |

## 12 පාඩම

### 12. 1 අභ්‍යාසය

| | | | |
|---|---|---|---|
| √वन्द् | वन्दानि | वन्दाव | वन्दाम |
| √चर् | चरनि | चराव | चराम |
| √पूज् | पूजानि | पूजाव | पूजाम |
| √प्र + सीस | प्रसीदानि | प्रसीदाव | प्रसीददाम |
| √रक्ष | रक्षानि | रक्षाव | रक्षाम |
| √नृत् | नृत्यानि | नृत्याव | नृत्याम |
| √भू | भवानि | भवाव | भवाम |
| √वि + मृश् | विमर्शयानि | विमर्शयाव | विमर्शयाम |
| √दृश् पश्य | दृश्यानि | दृश्याव | दृश्याम |
| √प्रीण् | प्रीणयानि | प्रीणयाव | प्रीणयाम |
| √धाव् | धावानि | धावाव | धावाम |
| √स्मृ + स्मर | स्मृरानि | स्मृराव | स्मृराम |
| √लभ् | लभानि | लभाव | लभाम |
| √लिख् | लिखानि | लिखाव | लिखम |
| √खन् | खनानि | खनाव | खनाम |

## 12. 2 අභ්‍යාසය

1 මම හොඳින් ශිල්ප ගනිම්වා.
2 අපි දෙදෙන පිරිවෙනට ගොස් පාඩම පාඩම් කරමෝවා.
3 අපි සත්පුරුෂයන් අනුගමනය කරමුවා.
4 මම හොඳ වචන කියම්වා.
5 අපි දෙදෙන දිනපතා බුදුන් පුදමුවා.
6 මම දැන් සංස්කෘත පාඩම් කරම්වා.
7 අපි ආචාර්ය උපාධ්‍යායන්ගේ දෙපා වඳිමුවා.
8 අපි දෙදෙන සත්‍ය රකිමුවා.
9 අපි අසත්පුරුෂයන් ඇසුරු නො කරමුවා.
10 මම නිදුක් වෙම්වා.

## 12.3 අභ්‍යාසය

१ जननी सुखिनी भवन्तु
२ भूपालाः धार्मिकाः भवन्तु
३ त्वं कूपात् जलं आहर
४ युवां सत्यं वदतम्
५ यूयं विहारं गच्छत
६ अहं स्वर्गं गच्छानि
७ आवां गृहं गच्छाव
८ वयं पण्डिताः भवाम
९ त्वम् अङ्गणे शीघ्रं धाव
१० वापी कमलैः भवताम्

## 12.1 ක්‍රියාකාරම

ගුරු :- සුභ උදෑසනක් වේවා.

ශිෂ්‍ය :- සුභ උදෑසනක් වේවා ගුරුතුමනී.

ගුරු :- සුනීත භික්ෂුව ඊයේ පිරිවෙණට ආවාද?.

ශිෂ්‍ය :- එහෙමයි ගුරුතුමනී,

ගුරු :- කිම ඊයේ විශේෂ පාඩමක් කළා ද?

ශිෂ්‍ය :- එහෙමයි ගුරුතුමනී, හොඳින් සංස්කෘත පාඩම් කියෙව්වා.

ගුරු :- හොඳින් පාඩම් කළාද? .

ශිෂ්‍ය :- එහෙමයි ගුරුතුමනි, සංස්කෘත භාෂාවෙන් මෛත්‍රී භාවනාව කොහොමද වඩන්නේ කියලා

ගුරු :- කොහොමද? මෙය හොඳින් අවබෝධ වුණාද?

ශිෂ්‍ය :- එහෙමයි ගුරුතුමනී

ගුරු :- මෙහි විශේෂත්වයක් තිබෙනවා එය කුමක් ද?

ශිෂ්‍ය :- ඒ පාඨයේ විශේෂත්වය නම්, ප්‍රාර්ථනාර්ථයෙහි ලෝට් ලකාරය ඉගෙනනීමට ඒ පාඨය ප්‍රමාණවත් බවය.

ගුරු :- එසේ නම් ඒ මෛත්‍රී භාවනාව උස් හඬින් කියත්වා.

## 12.4 අභ්‍යාසය

මම නිතර වෛර නැත්තෙක් වෙම්වා

මම මෙන්ම අන්‍ය සත්වයෝ ද, සැප කැමති වෙත්වා දුකට විරුද්ධ වූවෝ වෙත්වා

මම සතුට ඇත්තෙක් වෙම්වා දුක් නැත්තෙක් වෙම්වා

මා මෙන්ම මාගේ දෙමාපියෝ ද, ආචාර්ය උපාධ්‍යයන් වහන්සේලාද දූ පුතුන් ද, සහෝදර සහෝදරයෝ ද, ඥාති හිතවන්තයෝ ද,

සුවපත් වෙත්වා

නිදුක් වෙත්වා

නීරෝගී අය ද, සැපවත් අය ද,

මා මෙන්ම වෛරී සත්වයෝ ද,

සුවපත් වෙත්වා

අවෛරී වෙත්වා

නිදුක් වෙත්වා නීරෝගී වෙත්වා

කුසල් සිත් ඇත්තෝ වෙත්වා

මා මෙන්ම මෙහි වසන සියලු සත්වයෝ ද,

අපගේ ගම්වැසියෝ ද අන්ගම්වල අය ද,

අපගේ රටේ වසන්නා වූ ද, සියළු සත්වයෝ ද, වෛර නැත්තෝ වෙත්වා

ක්‍රෝධ නැත්තෝ වෙත්වා

හිංසා නැත්තෝ පීඩා නැත්තෝ වෙත්වා

අවමන් නොකරන්නෝ වෙත්වා සැප ඇත්තෝ සැපවත් වෙත්වා දුක් නැත්තෝ නීරෝගී වෙත්වා

සියල්ලෝම සුවපත් වෙත්වා

සියල්ලෝම  කරදර නැත්තෝ වෙත්වා

සිල්ලෝම යහපත දකීවා

කිසිවෙකු දුකට පත් නොවේවා

## 13 පාඩම

### 13. 1 අභ්‍යාසය

### බැඳුණු මාළුවා

එක් දිනක් මිනිස්සු ගඟේ දැළක් විසිකොට මාළු ඇල්ලීමට උත්සහ කරති. ඉක්බිති මහා මාළුවෙක් ආදරයෙන් පෙළුනේ කිසියම් මැසින්නක් සමග ඔබ මොබ හැසිර ආදරය උපදවා ඇය අනුව යයි. ඒ මැසින්න ඉදිරියෙන් දැල දැක එය මගහැර ගියේ ය. ඒ රතු මාළුවා වනාහි ඇයගේ පිටුපසින් ගොස් දැල තුළට පිවිසියේ ය. එයින් පිටට ඒමට නොහැකි වූයේ එම දැලෙහිම බැඳුනේ ය. මිනිස්සු ඒ දැලෙහි (මාළුවා) පැටළුණු බව දැනගෙන සියල්ලෝම රැස්වී උස්හඬින් ඝෝෂා කොට එය සෙමින් සෙමින් නදි තිරයේ උඩට අදිති. මාළුවා මහත්වූ ඝෝෂාව අසා (මෙසේ) සිතයි. මම දැලේ බැඳුනේ වෙමි. දැන් මරණය ඒකාන්ත යි. නමුත් දැන් කිසිසේත්ම මාව බාධා කොට (කළත්) ක්ලාන්ත නොවේ. ඇය වනාහි, ඇය මාව අතහැර සැබැවින්ම වෙනකෙනෙකු අනුව (සුපස) ගියේ නම් මා කෙරෙහි දුකක් වී මගේ සිත වෙහෙස කොට මාව පීඩා කොට හිංසාවට පත් කරයි. යනුවෙනි.

| | | |
|---|---|---|
| 1 ज्ञात्वा | දැනගෙන | 7 |
| 2 कृत्वा | කොට | 9 |
| 3 पीडयित्वा | පීඩා කොට | 15 |
| 4 मिलित्वा | රැස් වී | 8 |
| 5 श्रुत्वा | අසා | 10 |
| 6 श्रान्त्वा | වෙහෙස කොට | 14 |
| 7 जनयित्वा | උපදවා | 3 |
| 8 वृत्वा | මගහැර | 5 |
| 9 क्षिप्त्वा | වීසි කොට | 1 |
| 10 चरित्वा | හැසිර | 2 |
| 11 दृष्ट्वा | දැක | 4 |

| | | |
|---|---|---|
| 12 क्रीडित्वा | ක්‍රීඩා කොට | |
| 13 गत्वा | ගොස් | 6 |
| 14 बाधित्वा | බාධා කොට | 11 |
| 15 त्यक्त्वा | අතහැර | 12 |
| 16 भूत्वा | වී | 13 |

## 14 පාඩම

මේ චිත්‍රය බලන්න

එක් නදියක් මහා දියධාරාවක් දරා ගලා බසියි. ජලධාරාව ඉවුරට පැමිණ මල් ගෙන නදියටම පැමිණෙයි. මල් නදිය අලංකාර කොට දියධාරාව සමග ක්‍රීඩා කරන මෙන් පෙනෙත්. ඒවා ගස්වලින් වැටී ජලධාරාව ද නදීය ද අලංකාර කොට ඔබිනොබ සෙලවෙති. ජලධාරාව ගස් කඳන්වල මැද පිරි ගලාබසියි. කුරුල්ලෝ සතර දෙනෙක් ගස් අතර වසා උස්හඬින් නාද කර ඔබිනොබ බලති. උන් බියවී නාද කරති යැයි සිතමි. නදිය භූමිය පෝෂණයකොට නියඟය දුරුකොට ජනතාවට මහත් උපකාරකොට ගලා බසියි. සියල්ලෝම යහපත් ගුණ ඇත්තෝ ද අයහපත් වූවෝ ද නොවේ. යහපත් ගුණ ඇතිබවද, දුර්ගුණත්වය ද, ක්‍රියාවලින් විද්‍යමාන වේමය.

(එක් අයෙක්) දෝෂ ඇත්තෙක්ම වේ. ගුණ ඇත්තෙක් ම වේ. නිර්දෝෂී අය නූපදින්නේ ම ය මෘදු මොලොක් වු පියුමේ දණ්ඩේ කර්කෂ බව ඇත්තේ ම ය.

### 14.1 අභ්‍යාසය

1 සාමණේරයන් වහන්සේලා පිරිවෙනට ගොස් පන්තියේ ලියති.
2 අනෙක් සාමණේරයන් වහන්සේලා ද පොත් ගෙන පිරිවෙනට පැමිණෙති.
3 ඔවුහු ගුරුවරයා වැඳ පාඩම් කරති.
4 එක් ශිෂ්‍යයෙක් ගුරුවරයාගේ උපදෙස් අසා එක් ශ්ලෝකයක් මිහිරිව ගායනා කරයි.
5 සියල්ලෝ එය නැවත ගායනා කොට පොතෙහි පිටපත් කරති.
6 ඔවුහු ශ්ලෝක දෙකක් ගුරුවරයාට පෙන්වති.
7 ගුරුවරයා ඒ පිටපත් නිවැරදි කොට සිසුන්ට දෙයි.
8 සාමණේරයන් වහන්සේලා තමන් විසින් කළ පිටපත්වල නිවැරදි බව දැන සතුටු වෙති
9 ගුරුවරයා ඔවුන්ට උපදෙස් දී ඔවුන් සනසයි.
10 ශිෂ්‍යයෝ ගුරුවරයාගේ උපදෙස් සිතෙහි දරා ගුරුවරයාට වඳිති.

කතාබහා

ගුරුතුමා :- සුභ උදෑසනක්

ශිෂ්‍යයා :- සුභ උදෑසනක් ගුරුතුමනි

ගුරුතුමා :- කොහොමද සියලු දෙනා පාඩම් පාඩම් කොට පැමිණියෙහු ද?

ශිෂ්‍යයා :- ඔව් ගුරුතුමනි අපි පාඩමක් පාඩම්කොට එක් අභ්‍යාසයක් ද ලියා ආවෙමු

ගුරුතුමා :- විනීත මොකද නුඹ?

විනීත :- ගුරුතුමනී මම ඊයේ පිරිත් දේශනයකට ගොස් සූත්‍ර 07ක් ම දේශනා කොට නිදි නොලැබ උදෑසනම ආවෙමි. එහෙයින් පාඩම් නොකොට අකුරු පිටපත් කොට ම පැමිණියේ වෙමි.

ගුරුතුමා :- හෙට නුඹ ඊයේ කොටස තමන්ම කොට එහි පළමු අභ්‍යාසය ලියා මට පෙන්වන්න. මොකද අනිත් අය? සුධීර කොහේ ද?

සුබෝධි :- ඔහු ඔහුගේ අභ්‍යාස පොත මට දී හේතු ද කියා පරිවේණාධිපතිගේ නියෝගයෙන් දානමය පින්කමකට ගියේ ය.

ගුරුතුමා :- අද මම නුඹලාගේ පොත් ගෙන හරිද වැරදි ද බලා ගෙනෙමි. දැන් නුබලා තුන්දෙනා තුන්දෙනා බැගින් වී මාවිසින් අසන ප්‍රශ්න සාවධානව අසා පිළිතුරු සොයහු.

විමල :- උපාධ්‍යායන් වහන්ස, අද ශාන්ත නැහැ. ඔහු ඔහුගේ ගමේ නෑයෙකුගේ පාංශුකූලයකට ගිහිල්ලා. ඒ නිසා අපගේ කාණ්ඩායමේ එකෙක් අඩුයි.

ගුරුතුමා :- නැහැ නැහැ, ඉදින් කටයුත්ත සාර්ථක වෙනවා. දෙදෙනෙක් ද ප්‍රමාණවත්. එක් පහනක් ද එක් හඳක් ද අන්ධකාරය නසා අලෝකය දෙයි. එමනිසා නුඹලා දෙදෙන ප්‍රශ්න ගෙන මනාකොට සිතා ද ගවේශනය කොට ද ප්‍රති උත්තර අභ්‍යාස පොතේ ලියහු නුඹලා ද ශාස්ත්‍ර ගෞරවයෙන් මනාව අධ්‍යනය කොට ඥානාලෝකය වී ලංකාව බබලවවු.

ශිෂ්‍යයෝ :- එහෙමයි උපාධ්‍යායන් වහන්ස, අපි සියළු දෙනා ද එසේ ම ඉතා ඉක්මනින් වන්නෙමු.

14. 2 ක්‍රියාකාරකම

१ शिष्याः पाठान् पठित्वा, कक्ष्यां आगच्छन्ति ।

२ अहं पाठं पठित्वा, एकम् अभ्यासं लिखामि ।

३ एकः शिष्यः तथा कृत्वा कक्ष्यां न आगतवान् ।

४ कः परित्राणदेशनम् गत्वा निद्रां नालभत् च ।

५ विनीतः सप्तसूत्राणि देशयित्या, अक्षराणि प्रत्यलिखत् ।

६ अहं प्रतिलेखनं कृत्वा, गुरुं दर्शयामि शिष्याय ।

७ कः लेखनपुस्तकं शिष्याय दत्वा, हेतुं च कथयित्वा, कक्ष्यां न गच्छति ?

८ आचार्यः पुस्तकानि गृ हित्वा सावद्यं निरवद्यं च दर्शयति ।

९ छात्राः सम्यक् श्रुत्वा प्रत्युत्तराणि दत्वा तुष्यन्ति ।

१० शान्तः स्वग्रामे पांशुकूलम् इति जानित्वा दूरं गच्छति ।

११ चन्द्रः अन्धकारं नाशयित्वा आलोकं ददाति ।

१२ शिष्यौ प्रश्नन् सम्यग् चिन्तयित्वा अवदताम् ।

## 14.2 අභ්‍යාසය

1 සාමණේරවරු ගමට ගොස් පිඬු පිණිස හැසිරෙති.
2 ළමයි ක්‍රීඩාකොට නිවෙස් කරා යති.
3 ගොනා බර දරා සෙමින් සෙමින් යයි.
4 මව රස කැවිලි දී ළමයි සතුට කරවයි.
5 ශිෂ්‍යයෝ නදියේ නා විහාරයට පැමිණෙති.
6 දායකයා පොත් මිලදී ගෙන සාමණේරයන්ට දෙයි.
7 නුඹලා බුදුන් වැඳ පිරිත් කියහු.
8 ඇත්තු නදියෙන් ජලය බී වනයට යති.
9 හිරු පායා සත්වයින් අවදි කරවයි.
10 මිනිස්සු නාන ළිඳෙන් නා පූජා භූමියට ගොස් දෙවියෝ පුදති.

2

१ अहं अचार्यं वन्दित्वा परिवेणम् गच्छामि ।

२ मयं धर्मं देसित्वा जनान् तुष्याम ।

३ कुमरियोः उद्याने चरित्वा पुष्पानि ओचिनन्ति ।

४ सत्पुरुषाः पापेन विरमित्वा पंचसीलानि रक्षन्ति ।

५ कवयः ग्रन्ठानि रचयित्वा भाषां पोषयन्ति ।

६ माता नः पुष्यित्वा रन्ति ।

७ वानिजः रथे भाण्डानि पूरयित्वा नगरं गच्छति ।

८ श्रामनेराः अलंकार पुष्प उद्यानं दृष्ट्वा षत्र चरन्ति ।

९ दानपतिः मातापितरौ स्मरयित्वा दानं देति ।

१० गायकः गीतं गायित्वा जनान् तुष्यति ।

## 15 පාඩම

| | පූර්ව ක්‍රියා | තුමන්ත ක්‍රියා | පූර්ව ක්‍රියා | තුමන්ත ක්‍රියා |
|---|---|---|---|---|
| 1 | वन्दित्वा | वन्दितुम् | වැඳ | වඳින්නට |
| 2 | लिखित्वा | लिखितुम् | ලියා | ලියන්නට |
| 3 | दत्वा | दातुम् | දී | දෙන්නට |
| 4 | ज्ञात्वा | ज्ञातुम् | දැන | දැනගන්නට |
| 5 | नीत्वा | नेतुम् | ගෙනගොස් | ගෙනයන්නට |
| 6 | पठित्वा | पाठतुम् | පාඩම් කොට | පාඩම් කරන්නට |
| 7 | पीत्वा | पातुम् | බී | බොන්නට |
| 8 | वन्दित्वा | वन्दितुम् | වැඳ | වඳින්නට |
| 9 | गत्वा | गन्तुम् | ගොස් | යන්නට |
| 10 | छेत्व | छतुम् | සිඳ | සිඳින්නට |
| 11 | देशयित्वा | देशयितुम् | දේශනාකොට | දේශනා කරන්නට |
| 12 | स्नात्वा | स्नातुम् | ස්නානයකොට | ස්නානයකරන්නට |
| 13 | नत्वा | नेतुम् | ගෙනගොස් | ගෙනයන්නට |
| 14 | उत्त्वा | वक्तुम् | කියා | කියන්නට |
| 15 | जीवित्वा | जीवितुम् | ජීවත් වී | ජීවත් වන්නට |

2 1 ඔහු අකුරු මනාකොට ලියන්නට සමර්ථය.

2 මම දානයක් දීමට කැමති වෙමි.

3 ශිෂ්‍යයා ශ්ලෝකයේ අර්ථයකීමට උත්සහ කරයි.

4 කුමාරිකාව මල් නෙලීමට උයනට යයි.

5 මගියෝ නාන්නට පොකුණට පිවිසෙති.

6 සාමණේර පිරිවෙනට යන්නට ආශ්‍රමයෙන් නික්මෙයි.

7 ගොපල්ලා දෙන ගෙන එමට තණ බිමට යයි.

8 ඇත්තු දිය බිමට නදියට පැමිණෙති.

9 භික්ෂුව ධර්මය දේශනාකිරිමට ධර්මශාලාවට පිවිසෙයි.

10 ළමයා නිදන්නට ඇඳට ගොස් මව කැඳවයි.

11 සාමණේරයන් වහන්සේලා බුදුන් පුදන්නට විහාරයට පැමිණෙති.

12 අශෝක රජු කාලිංග දේශය දිනන්නට මහා යුද්ධයක් කළේය.

13 සියලු ශිෂ්‍යයෝ පාඩම් අසන්නට දේශන ශාලාවට ගියෝ ය.

## 16 පාඩම

චිත්‍රය බලන්න

ස්ත්‍රීන් සතර දෙනෙක් ජල පිණිස පැමිණියෝ ය. එක් ස්ත්‍රියක් ජලය ගෙන ගෙදර යයි. අනෙක් අය පොකුණෙන් ජලය ඇදිමට පටන් ගත්හ. ඒ පස් මිශ්‍ර වූ ජලයයි උෂ්ණ කාලයේ අපේ ප්‍රදේශයේ පිරිසිදු ජලය ලැබිමට මහත් උත්සහයක් කළයුතු ය. ඒ අතරතුර ස්ත්‍රීන් දෙදෙනෙක් සිනාසෙමින් සතුටින් කථාවෙහි යෙදෙයි. ජලය භාජනයෙන් පිටට වැගිරෙයි .එය නොදැන ඔවුහු කථාවට කැමති වෙති. මෙය මහා අපරාධයකි. ආහාර නැතිව අපහට කීප දිනක් ජිවත් වියහැක. ජලය නොමැතිව අපහට පැය දෙකක්වත් සැපයෙන් වාසය කිරිමට නොහැකිය. දිය උල්පත් සොබාදහමේ අතිශය අනර්ඝ අංගයකි. එබැවින් පණ දෙවැනි කොට අපවිසින් ජලය රැකිය යුතු ය.

16.2 අභ්‍යාසය

१ वनिता जलाय ग्रहीतुं आगम्य बिलात् जलं गृह्णाति।

२ सा जलं नेतुं द्वे भाजने एव अनयत्।

३ श्रामणेरः पुष्पणि चेतुं विहारोद्यानं गन्तुं चिन्तयति।

४ द्वे वनिते जलाय गत्वा कालं सल्लँपितुं च हसितुं च नयतः।


५ धनवान् आवश्यकानि महादानं दातुं चिन्तयित्वा द्रव्यानि चेतुं समारभत।

६ गजयूथः जलं पातुं नदि गन्तुं वनात् आगच्छति।

७ बुद्धाःवारणसी नाम नगरं धर्म देशयितुं आगच्छति।

८ पञ्चर्गीयाः भिक्षवः बुद्धं दृष्ट्वा प्रतिग्रहीतुं वा आतिथ्यं वा कर्तुं न गच्छामः इति आमन्त्रयन्।

1 ස්ත්‍රිය ජලය පිණිස ගැනිමට අවුත් වලෙන් ජලය ගනියි.
2 ඒ ස්ත්‍රිය ජලය ගෙනඒමට භාජන දෙක ම ගෙනගියා ය.
3 සාමණේරයන් වහන්සේ මල් කැඩිමට විහාර උයනට යන්නට සිතයි.
4 වනිතාවෝ දෙදෙන ජලය පිණිස ගොස් කාලයක් කතාවෙහි යෙදිමට ද සිනාසීමට ද ගතකරත්.
5 ධනවතුන් අවශ්‍ය අයට මහා දානයක් දීමට සිතා ද්‍රව්‍ය රැස්කිරිමට ආරම්භ කරති.
6 ඇත් රංචුව ජලය බිම පිණිස නදියට යාමට වනයෙන් පැමිණත්.
7 බුදුන් වහන්සේ බරණැස නම් නගරයට ධර්මය දේශනා කරනු පිණිස වැඩියහ.
8 පස්වග මහණුන් බුදුන් දැක පිළිගැනිමට හෝ ආගන්තුක වත හෝ කිරීමට නොයමු යැයි කතිකා කළහ.




2. කැමති වාක්‍යය 05ක් නිර්මානය කරන්න

# 17 පාඩම

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 श | स | 2 न | | 3 वि | 4 क | ति |
| | | 5 दि | 6 न | प्र | ति | |
| 15 च | | तु | म् | | | 8 प्र |
| 9 क्री | 10 तु | म | | 11 अ | र्ण | व |
| | ज | | | नु | | दि |
| 12 त | न् | तु | म् | | 14 पा | तु |
| 15 म | ति | | | 16 या | तु | म् |

## 17 .2 අභ්‍යාසය

1 ස්වාමියා සේවකයන්ට පඩි දී කතා කරයි.
2 දුව බල්ලාට ආහාර දීමට ගෙදරින් එයි.
3 උපාසිකාව අත් දෙකෙහි මල් දරා විහාරයට යයි.
4 සුළඟින් පර්වතය සොලවන්නට නො හැකි වෙයි.
5 දායකයෝ බුදුන් පුදා ථූපය පුදන්නට යති.
6 ළමයි මාළුන් දැක ගන්නට උත්සහ කරති.
7 සාමණේර දෙනම ගුරුවරයා වැඳ ඔහු සමඟ කතා කිරිමට කැමති වෙත්.
8 මිනිස්සු දණ්ඩක් ගෙන සොරාට තැලීමට දුවති.
9 බුදුන් වහන්සේ නාගදීපයට ගොස් නාගයන් දමනයට ධර්මය දේශනා කළේ ය.
10 ඔවුහු බෞද්ධ උපාසකයෝ වී පන්සිල් රකින්නට පොරොන්දු වූහ.

**2.**

१ श्रामणेरः पिण्डपातम् आनेत्वा विहारं आगच्छति ।

२ आचार्याः अध्ययितुं परिवेणं गच्छन्ति ।

३ शिष्याः पाठान् पठितुम् पंतिं आरभ्यति ।

४ वर्षाकाले मेघाः गर्जनं आगच्छति ।

५ गजाः जलं पीत्वा वनं प्रविशन्ति ।

६ वानराः वृक्षात् वृक्षं गत्वा फलानि खादितुं इच्छन्ति ।

७ पित्रः कूपं खनित्वा जलम् आह्वयतुम् श्रामयति ।

८ मित्रः कूपं खनितुम् मित्रम् आह्वयति ।

९ शिष्यः पाठं कथयित्वा लिखितुम् चिन्तयति ।

१० बालकः मातारं च पितरं च वन्दितुम् पाठशालं गन्तुम् गृहात् निष्क्रामति ।

17.3 අභ්‍යාසය

१ क्षालयितुं / गत्वा

२ हसित्वा / गत्वा

३ धावितुं / यातुं

४ पालयित्वा / लिखित्वा

५ कृत्वा / गत्वा

६ डयितुं / ग्रहीयुं

७ चरित्वा / क्रेतुं

८ उषितुं / आगन्तुं

17.3 අභ්‍යාසය

1 සාමණේරයන් වහන්සේලා උදෑසන අවදි වී මුහුණ සෝදා විහරයට ගොස් පූජා භාණ්ඩ සකස් කරති.
2 ගුරුවරයා ශිෂ්‍යයන්ට තෑගි දුන්නේය. ඔවුහු සිනාසී හිස නවා එවා ලැබුහ.
3 අශ්වයෝ වේගයෙන් දුවන්නට සමත්ය ඌ දුර ගමන් යන්නට යොදා ගනු ලැබෙති.
4 ධර්මාශෝක රජු ධර්මයෙන් රට පාලනය කොට ධර්ම උපදේශ ගල්වල ලියා සෑම තැන තැබිය.
5 ගොවියෝ කුඹුරුවල වැඩකොට සවස ගෙට ගොස් විශ්‍රාම ගනිති.
6 කුරුල්ලෝ අහසෙහි ඉගිලෙන්නට ද බිම පණුවන් කන්නට ද සමත් වූවෝ වෙති.
7 විදේශිකයෝ නගරයෙහි රථවල ඇවිද බඩු විකිණීමට කැමති වෙති.
8 මුනිවරු වනයෙහි වාසය කොට ගමට යන්නට සිතති.

# 18 පාඩම

## ලිපිය

අනුරාධපුර නන්දාරාමයේ නන්ද

2010 . 02 . 12

මිත්‍ර ආයුෂ්මත් ආනන්ද,

අද මගේ ගුරුවරයාගේ උපන් දිනයයි. අපි උන්වහන්සේට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කිරීමට දානමය පුණ්‍ය ක්‍රියාවක් කොට ආශිර්වාද කරමු. මම මගේ ගුරුවරයාගේ ගුණ සිහි කොට නුඹට කිසිවක් ලියන්න කැමති වෙමි.

පළමු වයසේ පැවැත්මෙන් මගේ ගුරුවරයා කරණ කොට පැවිදි භූමියට කරා කැමැත්තක් විය. ඔහුගේ පියා ඒ කරුණ දැන මගේ ගුරුවරයා සමග කතා කරන ලදි. එසේ වුවත් පියා ගුරුවරයා ගේ අටවෙනි වයසේ කාලය ගත කළේ ය. මව ඉතාමත් දුකට පත්විය. මගේ ගුරුවරයාගේ ගුරුවරයා මෙය දැන ඒ පැවිදි විමට මව සමග කතා කරන ලදි. ගුරුවරයාත් පැවිදි විමට ඉතා කැමැත්තෙන් වහාම එය පිළිගත්තේය.

උපාධ්‍යායගේ ගුරුවරයා ඉතා කාරුණික යයි ඔහු මට කීය. ඉදින් රෝගී වෙයි නම් සුව ගෙනදෙන සුදුසු ආහාර උයා කවයි. බෙහෙත් පාන වර්ග සම්පාදනය කරන්නට ද, සිවුරු සෝදන්නට ද, වෙහෙස වෙයි. මොහොතින් මොහොත සමිපයට පැමිණ දුකින් මාව බලා නිරෝගී බව විමසයි. අතුගෑම පිරිසිදු කිරිම් ආදි සියලු කටයුතු කරයි.

පින්වත් එතුමා නිතර මට ඉගෙනීමේ කටයුතු මනා කොට කරන්නට උත්සාහ විය. යම් කලෙක මම පිරිවෙනෙන් එම් ද එකල ඔහු දිනපතා මගේ පොත් ගෙන ලියූ ද කළ අභ්‍යාස ආදිය බලයි. අසම්පූර්ණ පාඩම් පාඩම් කරන්නට ද, ලියන්නට ද, බොහෝ කටයුතු කොට දිනපතා පිරිවෙනට යන්නට මම මෙහෙයවයි පිරිවෙනට ගිය කල්හි මගේ කුටිය පිරිසිදු කොට මගේ සිවුරු සිය අතින් සෝදා වේලා තබයි. සවස කිසියම් පානයක් සූදානම් කොට මගේ පිරිවෙනින් නැවත එන වෙලාව බලමින් පිළිගැනීමට දොරටුවෙහි සිටියි.

මගේ ගුරුවරයාගේ සෙනෙහස පුදුම එලවන්නකි. කිසියම් පියෙකුත් මෙසේ කරන්නට උත්සහ කරයි යැයි මම නො සිතමි. අද මම උතුම් විද්‍යාපීඨයක අනෙක් දහසක් ශිෂ්‍යයන් හික්වීමට උත්සාහ වෙමි. මේ උතුම් තැනට පැමිණෙන්නට මාගේ ගුරුවරයාගේ උපකාරය උපදේශයත් ඒකාන්තයෙන් ඉතා සෙනෙහස ද ප්‍රත්‍ය විය යැයි මට සිතෙමි. මිත්‍ර ආනන්ද, මේ සියලු වචන මාගේ ගුරුවරයාගේ බැඳුනු අව්‍යාජ වචනයි.

ඉදින් සියලු ගුරුවරුන් මේ හා සමාන වෙති ද, එකල්හි සියළු ශිෂ්‍යයෝ ද මහත් ගෞරවයෙන් භක්තියෙන් සෙනෙහසින් ද ගුරුවරුන් සතුටු කරන්නට සිතන්නේ නම් මැනවි. අපි දෙදෙනත් අනෙක් අයත් මනාකොට හික්මවා ඉගෙනීම කොට ඥානවන්තයන් වී ලෝකයාට සේවය කරන්නට ද ලෝකය බබුළුවන්නට ද පතුරුවන්නට ද උත්සාහ වෙමුයි මම පතමි.

මෙසේ කියයි

නුඹේ ප්‍රිය මිත්‍ර නන්ද

18. 1 අභ්‍යාසය

| | |
|---|---|
| १ आवाम् अपि अन्ये च साधुकं शिक्षयित्वा | १० भक्तया स्नेहेन च गुरून् सन्तर्पयितुं |
| २ लोकं विलसितुं कीर्तिं प्रस्तरितुं | ११ बाह्यानि कार्याणि वृत्वा प्रतिदिनं परिवेणं गन्तुं |
| ३ परः सहस्रान् शिष्यान् शिक्षितुं | १२ मम कुटीरं पवित्रं कृत्वा |
| ४ प्रत्यागमनवेलां विमर्शयन् प्रतिग्रहितुं | १३ गुरुः अपि प्राव्रज्यभूमिं प्रात्तुं |
| ५ सुखदायकं पथ्याहारं पत्तवा | १४ गुरोः गुणान् स्मृत्वा त्वां लिकितुं |
| ६ तस्मै दीर्घायुषं प्रार्थितुं | १५ असम्पूर्णान् पाठान् पटितुं लिकितुं च |
| ७ मम गुरोः प्राचार्यः इदं ज्ञात्वा | १६ इदं श्रेष्ठस्थानं प्राप्तुं |
| ८ मम पुस्तकानि गृहित्वा | १७ मे चीवराणि धिवित्वा च शोषयित्वा |
| ९ औष्धीयपानानि रचयितुं चीवराणि च प्रक्षालयितुं | १८ अध्ययनकार्याणि साधुकं कर्तुं एव |

1 අප දෙදෙනාත් අනෙක් අය ද මනා කොට හික්මවා
2 ලෝකය බබුළුවන්නට කීර්තිය පතුරුවන්නට
3 අනෙක් දහසක් සිසුන් හික්මවීමට
4 නැවත එන වේලාව විමසමින් පිළිගැනීමට
5 සුව ගෙනදෙන සුදුසු ආහාර උයා
6 උන්වහන්සේට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කිරීමට
7 මගේ ගුරුවරයාගේ ගුරුවරයා මෙය දැනගෙන
8 මගේ පොත ගෙන
9 ඔසුපැන් පිළියල කරන්නට ද සිවුරු සෝදන්නට ද
10 භක්තියෙන් සෙනෙහසින් ද ගුරුවරුන් සතුටු කරන්නට
11 බොහෝ වැඩ වළක්වා දිනපතා පිරිවෙනට යන්නට
12 මගේ කුටිය පිරිසිදු කර
13 ගුරුවරයාත් පැවිදිබිමට පැමිණීමට
14 ගුරුවරයාගේ ගුණ සිහිකොට නුඹ ලියන්නට
15 සම්පූර්ණ පාඩම් පාඩම් කරන්නට ලියන්නට ද
16 මේ උතුම තැනට පැමිණෙන්නට
17 මගේ සිවුරු සෝදා ද වේලා
18 ඉගෙනීමේ කටයුතු මනාකොට කරන්නට

18.2 අභ්‍යාසය

१ भिक्षुः विहारं गन्तु इच्छति।

२ गोपालः गां बन्धुं तृणभूमिं अगच्छति

३ जनाः गङ्गां तर्तुं पोतं आहरन्ति।

४ पन्थाः ग्रीष्मात् स्नातुं कासारं प्राविशत्।

५ बुद्धः जनान् संसारात् मोक्तुं धर्मं अदेशयत्।

६ कृषीवलाः क्षेत्रौ अपि तत्र तिष्ठन्ति।

७ तेयः श्रामणेरेयः इमान् त्यागान् दातुं इच्छामि अहं।

८ सर्वे सत्त्वाः सुखेन उषितुं यतन्तेम।

९ भिक्षवः समागच्छन्ति धर्मशालां परित्राणदेशनं प्रवर्तितुम्।

१० श्राद्धाः धर्मशालां सन्निपतन्ति नित्यं धर्मं श्रोतुम्।

११ सिद्धार्थकुमारः यशोधरादेवीं कुमारं च त्यक्तवा अभिनिष्कमितुं अचिन्तयत्।

१२ बहवः ग्रामवासीदायकदायिकाः युगासनधर्मदेशनं द्रष्टुं विहारं आयान्ति।

1 භික්ෂුව විහාරයට යන්නට කැමති වෙයි.
2 ගොපල්ලා ගවයා බඳින්නට තණ භූමියට ගියේ ය.
3 ජනයා ගංගාවෙන් එතෙර වෙන්නට ඔරුවක් ගෙන එති.
4 මගියෝ ග්‍රීෂ්මය නිසා නාන්නට විලට පිවිසෙත් .
5 බුදුරජාණන් වහන්සේ ජනයන් සසරෙන් මුදන්නට ධර්මය දේශනා කළේ ය.
6 ගොවියෝ කුඹුරු රකින්නට රෑත් එහි සිටිති.
7 ඒ සාමණේරයන් වහන්සේලාට මම මේ තෑගි දෙන්නට කැමැත්තෙමි.
8 සියලු සත්වයෝ සැපෙන් වසන්නට උත්සහ කරති.
9 භික්ෂුන් වහන්සේලා පිරිත් දේශනය පවත්වන්නට ධර්මශාලාවට පැමිණෙති.
10 සැදැහැවත්හු ධර්ම ශාලාවට නිතර ධර්මය ඇසිමට පැමිණෙති.
11 සිදුහත් කුමාරයා යශෝධරා දේවිය ද කුමාරයා ද අත්හැර අභිනිෂ්ක්‍රමණයට සිතී ය.
12 බොහෝ ගම්වැසි දායක දායිකා යුගාසන ධර්ම දේශනය දකින්නට විහාරයට යති.

18 . 3 අභ්‍යාසය

මෙම අභ්‍යාසය සරල බැවින් එය නොදක්වමි